**සී/ස මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම - 2020**
---------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**සී/ස මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.**

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.**

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතභාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

**1.5.1** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කනේවෙල අමුණ ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ මිලදීගෙන තිබුණු යකඩ කම්බි සහ යකඩ ගේට්ටු තොගය එම කොන්ත්‍රාත්තුව නතර කිරීම හේතුවෙන් මලකෑමට ලක්වෙමින් ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමට පත්වෙමින් පැවතුණි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයේ අංක 13.4 ඡේදය ප්‍රකාරව තොගයේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් එම යකඩ තොගයේ ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව රු.1,412,685 ක් වූ පිරිවැයට ගිණුම් ගත කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත අංක 13.4 වගන්තිය ප්‍රකාරව ශුද්ධ උපලබ්ධි අගය, එදිනට වෙළෙඳ පොල වටිනාකම ලෙස සලකා ගිණුම්ගත කර ඇත. නමුත් ආයතනයේ පරිපාලනයෙන් බැහැරවූ කරුණු හේතුකොට ගෙන එම තොගය තාක්ෂණික නිලධාරියෙකු ලවා වසරින් වසර අගය ගණනය කරගත නොහැකිවී ඇති අතර, (2018 සිට) මේ වනවිට තොගය බැහැර කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයේ 10.21 ඡේදය ප්‍රකාරව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි, අනුමත කරන මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගලපා සංසන්දනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර වැරදිවල ස්වභාවය හා ගලපන ලද ආකාරය | ඒ වනවිට මෙම සමාගම ඇවර කිරීමට බලාපොරොත්තුවෙන් කටයුතු කිරීම නිසා අවශ්‍ය තාක්ෂණ නිලධාරීන් ආයතනය හැරයාම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව අවසන් | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතුය. එසේ වුවද කනේවෙල අමුණ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ගිවිසුම් ප්‍රකාරව ඉටු නොකිරීම හේතුවෙන් පෙර වර්ෂයේ සිදුව තිබූ රු.2,730,169 ක මෙහෙයුම් අලාභය බැංකු ගාස්තු ලෙස ගිණුම්ගත කර තිබීමේ වරද මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව නිවැරදි කර නොතිබුණි. | කර ගැනීමට අවස්ථාවක් නොලැබීම හේතුවෙන් බැංකුව රඳවාගත් කාර්යසාධන වට්නාකම සහ අත්තිකාරම් සුරක්ෂණය අයකර ගෙන ඇත. මෙය ආයතනයේ පරිපාලනයෙන් බැහැරවූ සිදුවීමකි. | |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයේ අංක 17.19 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාගම සතු පිරිවැය රු.3,629,951 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 25 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | එම ප්‍රමිතගත කාරණය අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කොට පොත්වලට ඇතුළත් කිරීමට මෙම වසරේ සිට අවශ්‍ය කටයුතු කිරීමට කළමනාකාරීත්වය උපදෙස් දී ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළයුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වට්නාකම රු.2,972,630 ක් වූ ස්ථාවර තැන්පතුවක් මුදල් කරගැනීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලාඒමක් ලෙස සටහන් කළ යුතු වුවත් මුදල් ගලායාමක් ලෙස සටහන් කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දෝෂය 2021 වසරේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළයුතුය. |
| (ආ) | 2019 සැප්තැම්බර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/19/2550/104/076 මගින් මෙම සමාගම ඈවර කිරීමට අනුමැතිය දී තිබුණද පසුව 2019 ඔක්තෝබර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/19/2770/104/083 ප්‍රකාරව සමාගම කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා දීමට අනුමැතිය දී තිබුණි. ඒ අනුව මෙම සමාගම 2020 දෙසැම්බර් 30 දින සිට වාරිමාර්ග අමාත්‍යාංශය යටතට අනුයුක්ත කර තිබුණද එම ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාත්මක කිරීම හා සමාගමේ කොටස් හිමිකාරීත්වයේ සිදු වූ වෙනස්කම් පිළිබඳව සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව්කිරීමක්ද සිදුකර නොතිබුණි. | අදාල හිමිකාරීත්වය සම්පූර්ණ වනුයේ කොටස්වල අයිතිය පවරා ගත් පසු බැවින් කෙසේ නමුත් 2021 වර්ෂයේදී ඉහත කරුණු අපේක්ෂිත ප්‍රතිපත්තිමය තීරණයක් අනුව ගැනීමට බලාපොරොත්තු කරුණක් වූ බැවින්, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදුනොකරන ලදී. | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 5 ඉක්මවූ රු.7,718,908 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂයන් 9 ක් සඳහා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවුණි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇති රු.1,319,471 අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. වෙලි ආරක්ෂණ ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.442,647 ක් එම ව්‍යාපෘතිය අවසන් වී ඇති බැවින් අයකර ගැනීම ප්‍රශ්න සහගත වී තිබුණි. තවද ස්ථාවර වත්කම් යටතේ රු. 100,000 ක ශේෂයක්ද දිගින් දිගටම තහවුරු කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සියළුම ලැබිය යුතු ශේෂ සනාථ කිරීම සඳහා ලිපි යවා ඇත. කළමනාකාරීත්වයේ උපදෙස් අනුව කටයුතු කර මෙම ශේෂය 2021 මාර්තු වන විට රු.3,058,057 දක්වා ලබාගෙන ඇති අතර, මේ වනවිට එම ශේෂය රු.4,660,851 දක්වා අඩුකර ඇති අතර, ඉතිරි ශේෂ ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරගැනීම සඳහා කටයුතු කල යුතුය |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට රු.13,343,494 ක ගෙවිය යුතු ගිණුම් ශේෂයන් පැවති අතර ඉන් රු.10,243,521 ක් අවුරුදු 05 කට වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | වසර 5 ඉක්මවූ ගෙවිය යුතු ශේෂයන්ගෙන් රු.10,243,521 ක් 2020 දෙසැම්බර් 31 පෙන්නුම් කළද, කළමනාකාරීත්වයේ උපදෙස් අනුව ක්‍රියාක්මකවී 2021 අප්‍රේල් මස වනවිට රු.6,644,211 ක ගෙවිය යුතු ශේෂය පියවා ඇති අතර, ඉතිරි ශේෂ පෙන්නුම් කරනුයේ දැනට නිම නොවී පවත්නා ව්‍යාපෘතිවල අත්තිකාරම් රඳවා ගැනීම්ය. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරගැනීම සඳහා කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත්කර නොතිබුණි. | මෙතෙක් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ආයතනය ඉදිරිපත් කර නොමැති අතර, 2021 වර්ෂයේ සිට කෙටුම්පත් වාර්ෂික වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කරන බවට කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 13,924,210 ක පාඩුවක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 2,373,187ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,297,397 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාගම විසින් 2019 හා 2020 වර්ෂ සඳහා ව්‍යාපෘති හා ඉංජිනේරු අංශවලින් කිසිදු නව මෙහෙයුම් කටයුත්තක් භාරගෙන නොතිබීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් සහ වර්ෂය තුල සිදුකිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදනයන් ඇතුළත් කර ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඒ වනවිට මෙම සමාගම ඇවර කිරීමට තීරණය කිරීමේ හේතුවෙන් ඊට සුදුසු වූ පියවර ගනිමින් පැවති නිසා 2018, 2019 හා 2020 වර්ෂවල නව මෙහෙයුම් කටයුතු භාරගෙන නොතිබීම මත සමාලෝචිත වර්ෂයේ අපේක්ෂිත ක්‍රියාකාරී සැලැස්මක් සහ අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැත. එහෙත් 2021 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ආයතනය යළි ස්ථාපිත කර නව මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව අදාල සැලසුම් පිලියෙල කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් 2019 සහ 2020 වර්ෂ සඳහා ව්‍යාපෘති හා ඉංජිනේරු අංශවලින් කිසිදු නව මෙහෙයුම් කටයුත්තක් භාරගෙන නොතිබුණු අතර 2018 වර්ෂයේ සමාගමේ රු.90,203,907 ක් වූ මෙහෙයුම් ආදායම 2019 වර්ෂයේදී රු.29,808,040 දක්වා අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කිසිදු ආදායමක් ලැබී නොතිබුණු අතර රු.4,083,465 ක ස්ථාවර තැන්පතු පොළියක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව පෙර වර්ෂවල අඛණ්ඩව ලාභ ලබමින් පැවතුණි. සමාගම සමාලෝචිත වර්ෂයේදී රු.13,924,210 ක අලාභයක් ලබා තිබුණි. | ඒ වනවිට මෙම සමාගම ඇවර කිරීමට තීරණය කිරීමේ හේතුවෙන් ඊට සුදුසු වූ පියවර ගනිමින් පැවති නිසා 2018, 2019 හා 2020 වර්ෂවල නව මෙහෙයුම් කටයුතු භාරගෙන නොතිබීම මත සමාලෝචිත වර්ෂයේ කිසිදු ආදායමක් වාර්තා නොවීය. එහෙත් 2021 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ආයතනය යළි ස්ථාපිත කර නව මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යනු ලැබේ. | ආයතනික කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පියවර ගත යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී මොරගහකන්ද සංචාරක බංගලාව සහ නැරඹුම් මැදිරියේ ඉදිකිරීම් වෙනුවෙන් උප කොන්ත්‍රාත් ලබා දීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කිරීම නිසා සමාගමට රු.20,200,000 පාඩුවක් සිදුව තිබුණි. 2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාව විසින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කොට මාසයක් තුල කාරක සභාව වෙත වාර්තා කළ යුතු බව නිර්දේශ කර තිබුණද එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. විගණිත දිනය වූ 2021 අගෝස්තු 2 දක්වා අදාල මුදල් අයකරගැනීම සඳහා වන නෛතික ක්‍රියාමාර්ග ද ආරම්භකර නොතිබුණි. | මේ වනවිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කළ බවට නිරීක්ෂණය වන සභාපතිවරයා මියගොස් ඇති බැවින්, අයකර ගැනීම සඳහා ගතහැකි නීතිමය පියවරවලට උපදෙස් ගැනීමට නීතිපති උපදෙස් විමසා ඇති අතර, එම උපදෙස් ලැබීමෙන් පසු ඉහත ක්‍රියාමාර්ග ගනු ඇත. | පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාගම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොවූ අතර බඳවාගැනීමේ පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් හෝ අනුමත කරගෙන නොතිබුණි.මේ හේතුවෙන් සමාගමේ කාර්යය මණ්ඩලය සඳහා බඳවාගැනීම්, උසස්කිරීම්, තනතුරුවලට අදාල සුදුසුකම් සහ වැටුප් තීරණය කිරීම්වල නිවැරදිභාවය සම්බන්ධයෙන් පරීක්ෂාකිරීමට නොහැකි විය. | සමාගම ඈවර කිරීමට ගෙන තිබූ තීරණය හේතුවෙන් 2018 වර්ෂයේ සිට සමාගමේ මෙතෙක් කරගෙන ගිය ව්‍යාපෘති නතර කිරීමට සහ කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම්, වැටුප් වර්ධක අත්හිටුවීම් මත සමාගම සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් හා ඊට අදාලව බඳවා ගැනීමේ කාර්යය පටිපාටිය සම්බන්ධ කටයුතු සිදුකිරීමට නොහැකි තත්ත්වයකට පත්විය. 2021 වර්ෂයේ නව කළමනාකාරීත්වය යටතේ ආයතනයට ලැබෙන නව ව්‍යාපෘති සලකා බලා ඒ මත ආයතනික ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සලකා බලමින් සිටී. | කළමණාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවාගැනීම් සිදුකර ආයතන කටයුතු කාර්යක්ෂමව කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන උපදේශක සේවා ක්‍රියාත්මක කිරීමට අදාල කළමනාකාර (ව්‍යාපෘති) තනතුර සහ ඉංජිනේරු අංශයේ ඉංජිනේරු තනතුර 2019 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතියද 2021 සැප්තැම්බර් දක්වා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාගම ඈවර කිරීමට ගෙන තිබූ තීරණය හේතුවෙන් 2018 වර්ෂයේ සිට සමාගමේ මෙතෙක් කරගෙන ගිය ව්‍යාපෘති නතර කිරීමට සිදුවිය. එම නිසා අදාල තනතුරුවලට නිලධාරීන් පත්කළ නොහැකි වේ. | -එම |